සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය	කාලය / நேரம் / Time	පැය 2 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

❖ **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 20 කින් සමන්විතයි. දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.**

(01) පාසලක කාල සටහන සකස් කිරීම..... (ගුරුවරුන්, අංශ ප්‍රධාන, විදුහල්පති) ගේ කාර්යයකි.

(02) නිදහස් අධ්‍යාපනයේ පියා ..... (ඩී.ඒස්. සේනානායක, සී. ඩබ්ලිව් . ඩබ්ලිව් කන්නන්ගර, සේනක බිබිලේ) මහතාය.

(03) රත්නපුරය හා ..... සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක වේ. (අම්පාර, කෑගල්ල ,බදුල්ල)

(04) පාසලේ ..... යනුවෙන් අදහස් කරනුයේ පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරුය. (ඉතිහාසය, ඉගෙනීම ,සංස්කෘතිය)

(05) අතීතයේ සිට පැවත එන සමාජ සම්මතයන් ..... වේ. (නීතිරීති, සම්ප්‍රදායන්, හික්මීම)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න කියවා නිවැරදි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් වැරදි (×) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුල යොදන්න.**

(06) රීති යනු නොකළ යුතු බවට සම්මතයේ ඇති කොන්දේසි සමූහයකි. (.....)

(07) ස්වභාව ධර්මයෙන් අපට ලැබී ඇති දායාද සම්පත් ලෙස හැඳින්වේ. (.....)

(08) සක්‍රීය සවන්දීම යනු හුදෙක් අසා සිටීමයි. (.....)

(09) පොදු දේපළ පොදුවේ සැමට පරිහරණය කළ නොහැක. (.....)

(10) අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීමෙන් වැළකීම පරිසරය සුරැකීමට දායක විය හැකිය. (.....)

Past Papers Wiki

- **11 සිට 15 තෙක් ප්‍රකාශ වල "අ" තීරුවේ ඇති තොරතුරු "ආ" තීරුව හා ගළපා යා කරන්න.**

(අ)	(ආ)
(11) හොඳ ගති ලක්ෂණයකි	පාසලක පවතින නීතිරීති
(12) දිනපතා පාසලට පැමිණීම	ස්වභාවික සම්පත්
(13) භෞතික සම්පත් සංරක්ෂණය කිරීම	රටේ සංවර්ධනය සිදු වීම
(14) හිරු එළිය , ජලය	කාරුණිකබව
(15) මානව සම්පත් පුහුණු කිරීම	සම්පත් නාස්තිය අවම වීම

- **අංක 16 – 20 ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ.

I. සහෝදරත්වය
II. අසමගිය
III. සාර්ථකත්වය
IV. එකමුතුබව

(17) **ඇනුම් පද නොකියම් - බැනුම් කැත බස් නො කියම්** යන කවිය උපුටාගෙන ඇත්තේ,

I. සුභාෂිතය
II. ලෝවැඩ සඟරාව
III. සිරිත් මල් දම
IV. කාව්‍යශේකරය

(18) සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසියකි.

I. සතුටක් ඇති කරයි.
II. මේ කාර්යය අපහසු කරයි
III. ගැටව වැඩි කරයි
IV. කාලය නාස්ති වෙයි

(19) පාසල් ගීය ගායනා කරන අවස්ථාවේ දී දැකිය නොහැකි අවස්ථාව වන්නේ,

I. සිරුවෙන් සිටීමින් ගායනා කිරීම.
II. පාසල් ගීය මතකයෙන් තාලයට ගායනා කිරීම.
III. අභිමානයෙන් යුතුව ගායනා කිරීම.
IV. පහසුවෙන් සිටීමෙන් ගායනා කිරීම.

(20) ගොඩබිම දූෂණය වීමට හේතුවක් වන්නේ,

I. අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම.
II. කර්මාන්ත ශාලාවලින් පිටවන දුම
III. අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම
IV. පොලිතින් පිලිස්සීම

(ලකුණු 02 × 20 = 40)

Past Papers Wiki

II කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) I . ඔබේ පාසල ආරම්භ කිරීමට මුල් වූ හේතුව කුමක්ද? (ලකුණු 02)

II. පාසල් සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් කමිටු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

III. ඔබ තුළ ඇති හොඳ ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

IV. තමන්ගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

V. පාසලේ පවත්නා සම්ප්‍රදායයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. පාසල් ලාංඡනය භාවිතා කරන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

VII. වනාන්තර වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

VIII. සිද්ධස්ථාන මගින් සිදුවන සේවා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(02) I. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සපයා ගැනීමට උපකාරී වන මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති භූමිකාවන් දෙකක් ලියා දක්වන්න (ලකුණු 04)

III. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න

(03) I. පාසලකට සංවිධාන ව්‍යුහයක් අවශ්‍ය ඇයි? හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

II. ශිෂ්‍යයාවන්ගේ ජීව දත්ත තොරතුරු ලේඛනයක අඩංගු විය යුතු මූලික කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ඔබගේ දුර්වලතා දෙකක් සඳහන් කර ඉන් එකක් මගහරවා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) I. පාසලේ සංස්කෘතියට අයත් අංග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. පාසලකට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

III. ඔබගේ පාසලේ ශිෂ්‍ය හෝ ශිෂ්‍යාවගේ නියමිත නිල ඇඳුම ඇඳ දක්වන්න. (ලකුණු 05)

(05) I. ඔබ ප්‍රදේශයේ ඇති සමිති සමාගම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

II. අපට සේවා සපයන ආයතන වල යුතුකම් දෙකක් ලියන්න. (ලකුණු 04)

III. සේවා ලබන අපගේ යුතුකම් 03ක් ලියා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න . (ලකුණු 05)

(06) I. ඔබගේ පාසල අයත් පලාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. ඔබ ප්‍රදේශයේ ඇති ස්වභාවික සම්පත් දෙකක් හා ස්වභාවික නොවන සම්පත් දෙකක් සඳහන් කරන්න. (ලකුණු-04)

III. භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

(07) I. ජනතාව වෙනුවෙන් විවිධ සේවාවන් සපයන රජයේ නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III. සිද්ධස්ථාන මගින් සිදුවන සේවාවන් දෙකක් දක්වා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank